රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 367

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ - 07
1987 මැයි මස 06 වැනි දින.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

## රජයේ නිලධාරීන්ගේ විශ්‍රාම පූර්ව නිවාඩු, ඉකුත් නිවාඩු — ආයතන සංග්‍රහය - XII වන පරිච්ඡේදය.

(1) කරුණාකර 11 වන වගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත සඳහන් වගන්තිය ආදේශ කරන්න.

" 11. විශ්‍රාම පූර්ව නිවාඩු.

11:1. මෙහි 8 වන වගන්තිය යටතේ විවේක නිවාඩු ලබා ගැනීමට සුදුසුකම් ඇති රජයේ නිලධාරියෙකු විශ්‍රාම ගැනීමට පූර්වාසන්නව එසේ විශ්‍රාම ගන්නා අවස්ථාවේදී ඔහු ඉතිරි කරගෙන ඇති ඕනෑම පෙර වර්ෂ දෙකක ඉතිරි විවේක නිවාඩු විශ්‍රාම පූර්ව නිවාඩු ලෙස ඔහුට දිය හැකිය.

11:2. මෙම විශ්‍රාම පූර්ව නිවාඩුවට අමතරව, මෙහි 8 වන වගන්තිය යටතේ, පවත්නා වසර සඳහා ඔහුට හිමි විවේක නිවාඩුද දිය හැකිය.

11:3. මෙහි 26 වන වගන්තිය යටතේ නිවාඩු දෙනු ලබන කනිෂ්ඨ සේවකයෙකුට හෝ 27 වන වගන්තිය යටතේ නිවාඩු දෙනු ලබන දවස් පඩි පිට සිටින නිලධාරියෙකුට ඔහු විශ්‍රාම ගන්නා අවස්ථාවේදී එසේ විශ්‍රාම ගන්නා අවුරුද්ද වෙනුවෙන් සහ ඊට පූර්වාසන්න අවුරුද්ද වෙනුවෙන් ඉහත සඳහන් වගන්ති යටතේ ඉතිරිව ඇති අසනීප නිවාඩු ප්‍රමාණය විශ්‍රාම පූර්ව නිවාඩු වශයෙන් දිය හැකිය. ඔවුන් විශ්‍රාම ගන්නා අවුරුද්ද තුල වැඩ කර තිබේ නම්, එම අවුරුද්ද වෙනුවෙන් ඉතිරිව තිබෙන සියලුම අනියම් නිවාඩුද ඉහත සඳහන් නිවාඩු වලට අතිරේක වශයෙන් ඔහුට දිය හැකිය.

11:4. අකාර්යක්ෂමතාවය නිසා විශ්‍රාම ගන්වනු ලබන නිලධාරියෙකුට විශේෂ හේතූන් උඩ, විශ්‍රාම පූර්ව නිවාඩු දීම යුක්ති සහගත හෝ යෝග්‍ය හෝ වන අවස්ථාවලදී හැර, විශ්‍රාම පූර්ව නිවාඩු ලබා ගැනීමට හිමිකමක් නැත. එවැනි අවස්ථාවකදී ඒ බව සනාථ කිරීමට හේතු දක්වමින්, එම නිවාඩු සඳහා ඉල්ලුම් පත්‍රයක් ලේකම්වරයා වෙත යැවිය යුතුය.

11:5. සිය තනතුරෙන් ඉල්ලා අස්වීමේ ලිය කියවිලි භාර දී ඇති නිලධාරියෙකුට එම ලිය කියවිලි භාර දුන් දින සිට විවේක නිවාඩු හෝ අනියම් නිවාඩු හෝ කිසිවක් ලැබීමට හිමිකමක් නැත."

(11) කරුණාකර 10:1 උප වගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත සඳහන් උප වගන්තිය ආදේශ කරන්න.

"10:1. මෙහි 8:2 උප වගන්තිය යටතේ ලබා ගත හැකි විවේක නිවාඩු සියල්ල අවසන් වූ පසු නිලධාරියෙකුට තව දුරටත් නිවාඩු ලබා ගැනීමට අවශ්‍ය නම්, පහත සඳහන් උප වගන්ති වල නියමයන්ට යටත්ව, අවුරුදු දෙකක් සඳහා ඉතිරිව තිබෙන විවේක නිවාඩු ඔහුට ලබා දීමට දෙපාර්තමේන්තු ප්‍රධානියාට සිය අභිමතය පරිදි පුළුවන.

10:1:1. වෛද්‍ය හේතූන් මත නිලධාරියෙකුට තව දුරටත් නිවාඩු ලබා ගැනීමට අවශ්‍ය වේ නම්, ඔහුට වාසිදායක වන ඕනෑම (අනුගාමී වන හෝ නොවන) පෙර වර්ෂ දෙකක් සඳහා ඉතිරි විවේක නිවාඩුවන එකතුව ලබා දීමට පුළුවන.

10:1:2. වෛද්‍ය හේතූන් නොවන හේතූන් මත නිලධාරියෙකුට තව දුරටත් නිවාඩු ලබා ගැනීමට අවශ්‍ය වේ නම්, ඕනෑම අනුගාමී අවුරුදු දෙකක් සඳහා ඉතිරිව තිබෙන විවේක නිවාඩු ඔහුට ලබා දීමට පුළුවන.

10:1:3. ඕනෑම එක් අවුරුද්දක් තුළදී නිලධාරියෙකුට ලබා ගත හැක්කේ අවුරුදු දෙකකින් යුත් එක් කාල පරිච්ඡේදයකට අයත් ඉතුරු නිවාඩු පමණකි.

10:1:4. අනුගාමී අවුරුදු දෙකක් තුළදී නිලධාරියෙකුට දෙන ඉතුරු නිවාඩුවල එකතුව, අවුරුදු දෙකක ඔහුගේ සාමාන්‍ය නිවාඩු ප්‍රමාණය වන දින 48 ක් නො ඉක්මවිය යුතුය.

10:1:5. රෝගාතුර වීම හෝ හදිසි අනතුරක් සිදුවීම වැනි හේතූන් නිසා යම් නිලධාරියෙකුට නිවාඩු අවශ්‍ය වූ විට, ඔහුගේ පැවැත්ම සාමාන්‍යයෙන් හොඳවී නම්ද, ඔහුගේ වැඩ හා හැසිරීම යහපත් වී නම්ද, එහි නිර්ව්‍යාජත්වය ගැන තමාට පෞද්ගලිකව සෑහීමකට පත් විය හැකි වන්නේ නම්ද, වර්ෂ දෙකකදී නිලධාරියා ලබා නොගත් ඉතුරු නිවාඩු, එක් වර්ෂයක් ඇතුලත දෙවන වරටත් ලබා ගැනීමට සිය අභිමතය පරිදි ඉඩදීමට ලේකම්වරයාට පුළුවන.

මෙබඳු අවස්ථාවකදී අනුගාමී වර්ෂ දෙකක් ඇතුලත නිලධාරියෙකුට දෙන ඉතුරු නිවාඩුවල එකතුව, අවුරුදු හතරක ඔහුගේ සාමාන්‍ය නිවාඩු ප්‍රමාණය වන දින 96 නොඉක්මවිය යුතුය."

මෙම චක්‍රලේඛයේ විධි විධාන 1987.03.18 දින සිට ක්‍රියාත්මක වේ.

Siriwardhana

(ඩී.බී.අයි.පී.එස්.සිරිවර්ධන)
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.